සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව


## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## චිත්‍ර කලාව

කාලය : පැය 02 යි.
(I කොටස හා II කොටස සඳහා)

නම/විභාග අංකය :- ..............................................................................

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.



01. රූපයෙන් දක්වෙන ස්තූපය .............................................................................. නමින් හඳුන්වනු ලැබේ.

02. මෙම ස්තූපය .............................................................................. යුගයට අයත් වේ.

03. ස්තූපයේ ධාතු ගර්භය ..............................................................................හැඩයෙන් යුක්ත වේ.

04. බුදු රජාණන් වහන්සේගේ .............................................................................. මෙහි තැන්පත්කර ඇති බව වංශකතාවල සඳහන් වේ.

05. ලජ්ජතිස්ස රජතුමා විසින් ස්තූපය වටකොට .............................................................................. ඉදිකර ඇත.
(ලකුණු 2 × 5 = 10)

- **ප්‍රශ්න අංක 06 - 10 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර ඇතා සහ පැටවා නම් සිතුවම හමුවන්නේ,
(1) තන්තිරිමලේ ගුහාවෙනි
(2) බිල්ලෑව ගුහාවෙනි
(3) දොරවක ගුහාවෙනි
(4) වෙට්ටම්බුගල ගුහාවෙනි

(7) පැදුරු කර්මාන්තයේ දී පන් හා නියද, කහ පැහැයෙන් වර්ණ ගැන්වීම සඳහා භාවිතා කරන ලද්දේ,
(1) පතඟි දූව
(2) වෙනිවැල්ගැට
(3) ලුණු මිදෙල්ල
(4) කැළෑ කොහොඹ

(8) තෛපොංගල් උත්සවය කිනම් ආගමික උත්සවයක් ද?

(1) බෞද්ධ ආගමික උත්සවයකි.
(2) ක්‍රිස්තියානි ආගමික උත්සවයකි.
(3) ඉස්ලාම් ආගමික උත්සවයකි.
(4) හින්දු ආගමික උත්සවයකි.

(9) අනුරාධපුර යුගයට අයත් ජේතවනාරාම දාගැබේ හැඩය වන්නේ,

(1) බුබ්බුලාකාර (2) පද්මාකාර (3) ධාන්‍යාකාර (4) ඝණ්ඨාකාර

(10) හින්දු කෝවිල්වල දකගත හැකි ප්‍රධාන ගෘහ නිර්මාණ අංගයක් වන්නේ,

(1) ගෝපුරම (2) මිනාර් (3) අල්තාරය (4) කුරුසිය

(ලකුණු 1 × 5 = 5)


- ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✖) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

11. ඉස්ලාම් භක්තිකයින් උපවාසයේ යෙදෙන කාලයේ දී ශුද්ධ වූ "බයිබලය" කියවනු ලබයි. (..................)
12. කෝලම් රටා නිර්මාණය සඳහා කහ කුඩු හා සහල් පිටි යොදා ගනී. (..................)
13. පොත් පිටකවර යනු ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් නිර්මාණයකි. (..................)
14. කොළ වර්ණය සෑදීම සඳහා නිල් සහ රතු වර්ණ මිශ්‍ර කළ යුතුය. (..................)
15. සරල මුද්‍රණ ක්‍රමයේ දී අච්චු සාදා ගැනීමට අර්තාපල් හා කුරුම්බැට්ටි භාවිතා කළ නොහැක. (..................)


(ලකුණු 1 × 5 = 5)

- අංක 16 - 20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා A, B, C, D, E රූප ඇසුරින් පිළිතුරු තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.


A


B


C


D


E

16. පර්යාවලෝකය සහිත වූ සිතුවමකි. (.......................)
17. ත්‍රිමාණ ලක්ෂණවලින් යුක්ත වූ නිර්මාණයකි. (.......................)
18. ජනප්‍රිය රූකඩ වර්ගයකි. (.......................)
19. ලාංකීය ප්‍රාග් ඓතිහාසික ලෙනකින් හමු වූ සිතුවමකි (.......................)
20. අනුරාධපුර යුගයට අයත් කලාත්මක නිර්මාණයකි. (.......................)

(ලකුණු 2 × 5 = 10)

- අංක 20 - 25 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(වකදෙක/ සලපතල මළුව / රංජිත වීදුරු / බුමුතුරුණු / පර්යාලෝකය)

21. චෛත්‍යය වටා ඔප මට්ටම් කරන ලද ගල් පතුරු අතුරා ...................................................................... නිර්මාණය කර ඇත.
22. ක්‍රිස්තියානි දේවස්ථානවල තුඩු සහිත කවුළු ...................................................................... වලින් අලංකාර කර ඇත.


23. පැරණි ශිල්පාචාර්යවරුන්, ආධුනික ශිල්පියාට ලබා දුන් මුල්ම රේඛා අභ්‍යාසය ........................................................................ නම් වේ.



24. ළඟ ඇති වස්තුන්ට වඩා දුර ඇති වස්තුන් කුඩා වී පෙනීම ........................................................................ නමින් හැඳින්වේ.


25. මුළුතල මෝස්තරයක් සඳහා උදාහරණයක් ලෙස ........................................................................ දැක්විය හැක.



(ලකුණු 2 × 5 = 10)


- අංක 26 - 30 දක්වා දී ඇති රූපවලට ගැළපෙන රූපයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

26.  (..........................) F 

27.  (..........................) G 

28.  (..........................) H 

29.  (..........................) I 

30.  (..........................) J 

(ලකුණු 2 × 5 = 10)

## II කොටස

* පහත දැක්වෙන ''අ'' , ''ආ'' හා ''ඉ'' යන කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

''අ'' කොටස (ප්‍රකාශන චිත්‍ර)

1. පාසල් විවේක කාලයේ පිට්ටනියේ ක්‍රීඩා කරන ළමුන් පිරිසක්
2. මහ වනයක මුව රංචුවක් පසුපස එළවා යන කොටියෙක්
3. උදෑසන පාසල් යන සිසුන් පිරිසක්

''ආ'' කොටස (මෝස්තර චිත්‍ර)

4. කුරුළු රූප යොදා ගනිමින් චීත්ත රෙද්දකට මෝස්තරයක්
5. සත්ත්ව රූපයක් භාවිත කරමින් සමචතුරස්‍රාකාර හැඩයේ කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක්.

''ඉ'' කොටස (ග්‍රැපික් චිත්‍ර)

6. පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංගය සඳහා සුදුසු ආරාධනා පත්‍රයක්
7. පාසලේ වාර්ෂික චිත්‍ර ප්‍රදර්ශනය සඳහා දැන්වීමක් නිර්මාණය කරන්න. (ලකුණු 50)